ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**තාක්ෂණ අමාත්‍යාංශය**

**පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

DRP

# විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ පුරප්පාඩු

තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ (ඇමෙරිකානු ඩොලර් මිලියන 50 ට වැඩි හෝ එයට සමාන සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 100 ට අඩු ආයෝජනය) පහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ප්‍රසම්පාදන විශේෂඥ : PS3 (තනතුරු 1)

### රැකියා පැතිකඩ

- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුම
- පහත කරුණු පිළිබඳ විස්තීර්ණ අවබෝධය සහ පළපුරුද්ද
  - අවශ්‍යතාව අනුව ලංසු කැඳවීමේ මාදිලියන් තෝරාගැනීම
  - ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු
  - ප්‍රසම්පාදන මාදිලීන්ට අදාළ විවිධ ආකාරයේ ලංසු ලේඛන සකස් කිරීම
  - ලංසුකරුවන් සඳහා වන උපදෙස් සහ පොදු කොන්ත්‍රාත් කොන්දේසි
  - ලංසු ඇගයීමේ ක්‍රියා පටිපාටි
  - අභියාචනා ක්‍රියාවලිය
  - ටෙන්ඩර් පිරිනැමීම, කොන්ත්‍රාත් ගිවිසුම් සහ පශ්චාත් පිරිනැමීම් ක්‍රියා පටිපාටි
- ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනයන් කලට වේලාවට ඵලදායීව සිදු කිරීම තහවුරු කිරීම

### අවශ්‍ය පළපුරුද්ද සහ සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3)

1. ක්ෂේත්‍රයට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූලික උපාධියක් ලබා තිබීම හෝ ක්ෂේත්‍රයට අදාළ උපාධියට සමාන සුදුසුකමක් බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් හෝ ආශ්‍රිත සාමාජිකත්වයක්/ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්

   සහ

   අවම වශයෙන් වසර 10 ක කළමනාකරණ මට්ටමේ තනතුරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම

2. ක්ෂේත්‍රයට අදාළව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූලික උපාධියක් ලබා තිබීම හෝ ක්ෂේත්‍රයට අදාළ උපාධියට සමාන සුදුසුකමක් බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක් හෝ ආශ්‍රිත සාමාජිකත්වයක්/ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ ආයතනික/වරලත් සාමාජිකත්වයක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්

   සහ

   අවම වශයෙන් වසර 8 ක කළමනාකරණ මට්ටමේ තනතුරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම

3. රජයේ දීප ව්‍යාප්ත සේවාවක පළමුවන පංතියේ නිලධාරියෙක් හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්

   සහ

   අවම වශයෙන් පළමුවන පංතියේ තනතුරක වසර 03 ක පළපුරුද්ද

## කාර්මික නිලධාරී - PS6 A කාණ්ඩය (තනතුරු 1)

### රැකියා පැතිකඩ

- සිවිල් ඉදිකිරීම් වැඩවලට අදාළ සැලසුම්, ප්‍රමාණ පත්‍ර, ඇස්තමේන්තු සහ පිරිවිතරයන් සකස් කිරීමේ හැකියාව
- සිවිල් ඉදිකිරීම් වැඩ අධීක්ෂණය සහ කාර්මික උපදේශන සඳහා ඇති හැකියාව
- ඉදිකිරීම් අධීක්ෂණය කිරීමට සහ ගෙවීම් පත්‍ර සකස් කිරීමේ හැකියාව
- සම්පූර්ණ කිරීම් වාර්තා සකස් කිරීමේ හැකියාව
- රජයේ නීති සහ රෙගුලාසි පිළිබඳ දැනුම
- පරිගණක පරිසරය තුළ වැඩ කටයුතු කිරීමේ හැකියාව
- කණ්ඩායම් තුළ වැඩ කටයුතු කිරීමේ හැකියාව

### අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද:

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ මූලික උපාධිය

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන බවට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්

   හෝ

   ආශ්‍රිත සාමාජිකත්වය/ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක්

   හෝ

   තාක්ෂණික ක්ෂේත්‍රයේ තනතුරකට සුදුසු බවට තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම (7) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම

   හා

   අවශ්‍ය විශේෂඥ ක්ෂේත්‍රය තුළ අවම වශයෙන් වසර 2 ක පළපුරුද්ද

2. තාක්ෂණික ක්ෂේත්‍රයේ තනතුරකට සුදුසු බවට තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම (6) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම

   හා

   අවශ්‍ය විශේෂඥ ක්ෂේත්‍රය තුළ අවම වශයෙන් වසර 07 ක පළපුරුද්ද

3. තාක්ෂණික ක්ෂේත්‍රයේ තනතුරකට සුදුසු බවට තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම (5) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම

   හා

   අවශ්‍ය විශේෂඥ ක්ෂේත්‍රය තුළ අවම වශයෙන් වසර 12 ක පළපුරුද්ද

### පොදු කොන්දේසි

- වැටුප සහ අනෙක් දීමනා, 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 මත පදනම් වේ.
- වයස අවුරුදු 63ට නොවැඩි විය යුතු ය.
- ව්‍යාපෘතිය විසින් සේවක අර්ථ සාධක අරමුදලට 12% ක් හා සේවකයා විසින් 8% ක් ද සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක දායකත්වයක්ද ලබා දෙනු ලැබේ.
- පත්වීම කොන්ත්‍රාත් පදනමින් සිදුවන්නක් වන අතර ව්‍යාපෘතියේ අවශ්‍යතාව අනුව වාර්ෂික කාර්ය සාධන ඇගයීමට යටත්ව සේවය අලුත් කිරීමක් සිදුවෙනු ඇත.

සියලුම විස්තර සහිත අයදුම්පත්‍ර(සහතිකවල ඡායාපිටපත් සමග), ව්‍යාපෘති අධ්‍යක්ෂ, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය, 10 මහල, බී පර්යන්තය, සුහුරුපාය, බත්තරමුල්ල ලිපිනයට 2021 පෙබරවාරි 7 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**ලේකම්,**

**තාක්ෂණ අමාත්‍යාංශය**